# රූපවාහිනිය කලා මාධ්‍යයක් වශයෙන් භාවිත කිරීමේ ශක්‍යතා පිළිබඳ විමර්ශනයක්

ආචාර්ය එල්. ටියුඩර් වීරසිංහ

රූපවාහිනිය සිනමාවේ සෘජු අනුප්‍රාප්තිකයා වශයෙන් හැඳින්විය හැකිය. ආරම්භයේ දී සිනමාව මග තොටේ දී දුම්රිය නැවැතුම් පොළේ, වැඩ පොළේ ආදී ස්ථානවල සැබෑ ජීවිතය නිරූපණය කළේය. අද එය වාර්තා චිත්‍රපට වශයෙන් හැඳින්විය හැකිය. කලා ප්‍රභේදයන්ගේ ඓතිහාසික සම්භවයේ දෘෂ්ටිකෝණයට අනුව සිනමාව සත් වැනි කලා මාධ්‍යය වශයෙන්  සනිටුහන් වන අතර, එහි තාර්කික සහ ඓතිහාසික අනුප්‍රාප්තිකයා වූ රූපවාහිනිය අට වැනි කලා මාධ්‍යය ලෙස හැඳින්වීම සාධාරණ වේ. සිනමාව, චිත්‍ර, නාට්‍ය හා රංග කලාව, සාහිත්‍යය, ඡායාරූප ශිල්පය ආදී කලා ප්‍රභේදයන්ගේ සංශ්ලේෂීය කලා මාධ්‍යයන් වන්නා සේම රූපවාහිනිය ද එලෙස සංශ්ලේෂීය කලා මාධ්‍යයක් වශයෙන් සැලකිය හැකිය. නමුත්, රූපවාහිනිය සංශ්ලේෂීය කලා මාධ්‍යයක් වන්නේ ඊට වඩා වෙනස් ගුණාත්මක සහ ප්‍රමාණාත්මක තලයකදීය. එක් අතකින් සෑම කලා ප්‍රභේදයක්ම එය ඓතිහාසික වර්ධනය තුළ සිය අනන්‍යතාව, සුවිශේෂත්වය ආරක්ෂාකර ගැනීමේ ස්වාභාවික ප්‍රයත්නයක පසුවන අතර, අනෙක් අතින් විවිධ කලා ප්‍රභේදයන්ගේ අත්දැකීම් ලබාගැනීමේ, මිශ්‍රණය වීමේ හා සමීපවීමේ නොවැළැක්විය හැකි අභ්‍යන්තර ප්‍රවණතාවක් දක්නට ලැබේ.

සිනමාවත්, රූපවාහිනියත් කතා කරන්නේ තිරභාෂාවෙනි. තිර මාධ්‍යය යනු නව කලා

ප්‍රභේදයක් පමණක් නොව එය මානව සංහතියට නව භාෂාවක් ද උරුමකර දුන්නේය. සිනමාවේ සහ රූපවාහිනියේ භාෂාව චලනීය ප්‍රතිරූපයේ භාෂාවයි. චලනය වන්නා වූ ප්‍රතිරූපීය භාෂාව වචන, සංගීතය, හඬ, නිශ්චලතාව ආදී මාධ්‍යන්ගෙන් සංයෝජිත වන්නේය. සිනමාවේ සහ රූපවාහිනියේ භාෂාව ශ්‍රව්‍ය-දෘශ්‍ය රූපකයකි. තිරභාෂාව නිර්මාණය කළේ සහ සංවර්ධනය කළේ සිනමාව විසිනි. රූපවාහිනිය සිනමාවෙන් එහි තිරය සමඟ ප්‍රබල, ගැඹුරු, නම්‍යශීලී, සියුම් ප්‍රකාශන මාධ්‍යයන් අත්පත්කර ගනිමින් ඒවා රූපවාහිනී මාධ්‍යයේ සුවිශේෂිතා සමඟ විකරණය කර ගන්නේය.

සිනමාවේ මෙන්ම රූපවාහිනී මාධ්‍යයේ භාෂාවේ පදනම සහ මූලයන් පොදුවේ. මෙම මාධ්‍යයන් දෙක අබියස සිටිනා ප්‍රේක්ෂකයා ඉදිරියේ ඇත්තේ ද්විමානිය තිරයකි. සිනමාව සහ රූපවාහිනී මාධ්‍යය අතර සෞන්දර්යාත්මක වෙනස්කම් පවතින්නේය. නමුත්, එම වෙනස මූලික සහ ප්‍රතිපත්තිමය නොවේ. එය හරියටම සාහිත්‍යය සහ ලලිත කලාව හෝ සිනමාව සහ රංග කලාව අතර පවතින වෙනස්කම් හා සමානය. සිනමාවේම සමහර ප්‍රකාශන විධීන් රූපවාහිනියට ගමන් කිරීමේ දී සැලකිය යුතු වෙනස්කම්වලට ලක් වී ඇත. තවත් සමහර ප්‍රකාශන විධීන් ඒ ආකාරයටම රූපවාහිනියට පැමිණ තිබෙන අතර, සමහර ප්‍රකාශන විධීන් කිසිම ලෙසකින් හෝ රූපවාහිනියට ගමන් නොකළේය. මෙම ක්‍රියාවලිය කුමන ආකාරයට තත්ත්වාරෝපණය වූවාද? රූපවාහිනියට කුමන විශේෂතා අත්‍යවශ්‍ය වූයේද යන්න සොයා බැලිය යුත්තේ රූපවාහිනී මාධ්‍යය කලා මාධ්‍යයක් වශයෙන් එහි නිහිත සුවිශේෂතා නිශ්චය කිරීම හරහාය.

පූර්ව රූපවාහිනී කලා මාධ්‍යයන්ගේ රූපවාහිනී මාධ්‍යය අත්පත් කරගන්නා ලද ගති ලක්ෂණ පිළිබඳ අවධානය යොමු කිරීම ඉතා වැදගත් වන්නේය. රූපවාහිනී මාධ්‍යයට වඩාත්ම සමීප ජනසන්නිවේදන මාධ්‍යයන් වශයෙන් මෙන්ම කලා මාධ්‍යය ප්‍රභේදයන් වශයෙන් ක්‍රියාකළ රංග කලාව, සිනමාව සහ ගුවන්විදුලි මාධ්‍යය පිළිබඳව විශේෂයෙන් සලකා බැලීම වැදගත් වන්නේය. දෙබස්, ක්‍රියාකාරිත්වය, රංග හරඹ රූපවාහිනී මාධ්‍යය රංග කලාවෙන් ලබාගත් විශේෂ ලක්ෂණ වන අතර, ප්‍රකාශන, නිරූපණ මාධ්‍යයන් රූපවාහිනී මාධ්‍යය සිනමාවෙන් ගත් ලක්ෂණ වේ. සෑම පුද්ගලයකුටම හා සෑම නිවසකටම සමීපවීමේ සර්ව භෞමික ව්‍යාප්තිකරණය සහ එකවර සෑම තැනකම පැවැත්මේ හැකියාව රූපවාහිනී මාධ්‍යය ගුවන්විදුලි මාධ්‍යයෙන් අත්පත් කර ගත් ගති ලක්ෂණයකි.

කලා මාධ්‍යයක් වශයෙන් රූපවාහිනී මාධ්‍යයේ විශේෂත්වය එක් අතකින් රූපවාහිනී මාධ්‍යයටම ආවේණික සුවිශේෂතා මත ද, අනෙක් අතින් අදාළ සමාජයේ කලාත්මක වර්ධනයේ පොදු මට්ටම මත ද රඳා පවතියි. කලාත්මක ප්‍රකාශනයක භූමිකාව ප්‍රවර්ධනය වීම ම නව්‍යතාවයේ ලක්ෂණයකි. සමාජ ජීවිතයේ වඩාත් සංවේදී ගැටලු කෙරෙහි නිර්මාණාත්මක බුද්ධි ප්‍රජාවේ ක්‍රියාකාරිත්වය රූපවාහිනී ප්‍රකාශන තුළින් පිළිබිඹු විය යුතුය. මෙහිදී සමාජ දේශපාලන ප්‍රකාශනයේ ආකෘතිය වෙනස් වන අතර, එය බොහෝ විට සම්මුඛ සාකච්ඡාමය හෝ සංවාදශීලී හෝ කතිකාමය ස්වරූපයක් ගනු ඇත. මෙහි අරමුණ වන්නේ රූපවාහිනී ප්‍රේක්ෂකයාට සමාජයේ වැදගත් ප්‍රශ්න පිළිබඳව ඒ හෝ මේ ස්ථාවරය ගැනීම සඳහා උදව් කිරීමයි.

රූපවාහිනිය සතු විවිධ වැඩසටහන් වර්ග, ස්වරූප සහ ආකෘති වඩාත් ප්‍රජාතන්ත්‍රීය ගති ලක්ෂණ ගන්නා අතර, එසේම ඒවා මඟින් රූපවාහිනී ප්‍රේක්ෂකයා තුළ සෞන්දර්යාත්මක ප්‍රජාතනමය ආකර්ෂණය වර්ධනය වීම ද සිදු වන්නේය.

රූපවාහිනිය තුළ ලේඛකයා ගේ ඉදිරිපත් කිරීම බොහෝ දුරට රඳා පවතින්නේ ඔහුගේ කුසලතාවය මතය. එනම් කතා කිරීමට, සාකච්ඡා කිරීමට, සංචලන නම්‍යශීලිතාව, රූපවාහිනි ප්‍රේක්ෂකයින් සමඟ ඇති කරගන්නා අදහස්මය සබඳතාව එම කුසලතා අතර වේ. නමුත්, ලේඛකයාට රූපවාහිනිය දක්වා වූ මාවත සරල නොවේ. එය රූපවාහිනි සේවකයින්ගේ උදාසීන ක්‍රියාකාරිත්වය හෝ ලේඛකයාගේ සාම්ප්‍රදායික වැඩ කිරීමේ ශෛලිය පමණක් නොවේ. මෙහිදී ඉතා වැදගත් වන්නේ නිර්මාණාත්මක ක්‍රියාකාරිත්වයේ ස්වරූපයක් වන ලේඛකයාගේ නිර්මාණාත්මක ශ්‍රමයේ පුද්ගලවාදී ස්වභාවයයි. ලේඛකයාගේ ශ්‍රමය මූලික වශයෙන් පුද්ගලවාදී වන අතර, රූපවාහිනී සම්ප්‍රේෂණ ක්‍රියාවලිය  නිර්මාණය කිරීම දහයක් හෝ පහළොවක් වූ නිර්මාණාත්මක සමූහයකගේ ප්‍රතිඵලයකි.

රූපවාහිනි වාර්තා චිත්‍රපට සමඟ ලේඛකයාග් සහභාගිත්වය කේන්ද්‍රීය ස්වරූපයක් ගනී. මෙහි ලේඛකයා අධ්‍යක්ෂකවරයා සහ කැමරා ශිල්පියා සමග අදහස් සකස්කර ගැනීමත් වැඩ කිරීමත් අවශ්‍ය මිනිසුන්, ස්ථාන ආදිය හඳුනා ගැනීමට යාමත් සිදුවන්නේය. එනම් රූපවාහිනී වාර්තා චිත්‍රපටයක් නිර්මාණය කිරීමේ ක්‍රියාවලියේ දී ලේඛකයා කණ්ඩායමින් පිට නොව අභ්‍යන්තරයේ සිටිය යුතුවේ. රූපවාහිනිය ලේඛකයා අබියස නව ශක්‍යතා සහ පුළුල් පරාසයන් විවෘත කරන ලදී. ලේඛකයින් සිය පාඨකයින් සමඟ සජීවීව අදහස් හුවමාරු කර ගැනීමට හැකියාව උදා කළේය. රූපවාහිනියේ ව්‍යාප්තියත් සමගම සාහිත්‍ය පත පොත පරිශීලනයෙන් පාඨකයින් ඈත් වනවාය යන අදහස මූලික වශයෙන් කැනේඩියානු සංස්කෘතික හා සාහිත්‍ය විචාරකයකු වූ මාෂල් මැක්ලුහන් ප්‍රකාශ කළත් එය එසේම නොවන බව සමාකාලීන රූපවාහිනිය භාවිත කරන ආකාරය  පෙන්වා දී තිබේ. සම්භාව්‍ය සාහිත්‍යය කෙරෙහි පාඨක ආකර්ෂණය තබා ගැනීමට රූපවාහිනී මාධ්‍යය කලා මාධ්‍යයක් වශයෙන් යොදාගත හැකි බව තහවුරු වී ඇත. මේ අනුව පෙනී යන්නේ රූපවාහිනී මාධ්‍යයේම නිලීන සුවිශේෂතාවලට වඩා එම මාධ්‍යය භාවිතයට ගන්නා සමාජ දේශපාලනික සන්දර්භය ද වැදගත් වන බවයි.

රූපවාහිනී කලා මාධ්‍යයට සාහිත්‍ය නිර්මාණයක් පරිවර්තනය කිරීමේ දී ලේඛකයා ස්ථිතික අවස්ථාවන් චලනීය නිරූපණ ක්‍රියාවලියකට මිශ්‍ර කරන ආකාරය පිළිබඳව අවබෝධ කරගත යුතු වේ. මෙහි දී චලනය නිරූපිත ක්‍රියාවලිය සහ ස්ථිතික අවස්ථාවන් එකිනෙකට සමපාත බව රූපවාහිනී ප්‍රේක්ෂකයාට හැඟී යායුතු වීම වැදගත්ය. වචනවලින් පෝෂණය වී ඇති මෙවැනි සංකලනාත්මක නිරූපණ මගින් ඉතා විශාල ලෙස සාහිත්‍යයික ශ්‍රමය (ලේඛක ශ්‍රමය) බලපෑම උත්කර්ෂණය කරන බව අවිවාදිත වේ. මේ කෙසේ වෙතත් සාහිත්‍ය නිර්මාණ රූපවාහිනී තිරකරණයට ලක් කිරීම පිළිබඳව බොහෝ විවාද පවතී. කිසිම හෝ රූපවාහිනී තිරකරණයකට සම්පූර්ණයෙන්ම අදාළ සාහිත්‍යයික කතා වස්තුවේ සියලුම පැතිකඩයන් ආරක්ෂා වන ආකාරයටත්, මානව ආත්මයේ සියුම් තත්ත්වයන් සහ මනෝ විද්‍යාත්මක සංකීර්ණ ගතිකයන් ඒ ආකාරයෙන්ම නියෝජනය කිරීමත් චරිතවල අභ්‍යන්තර මනෝ ගතිකයන් නියමාකාරයට පිළිබිඹු කිරීමත් කළ නොහැකිය. එම රූපවාහිනී තිරකරණයට ලක් කිරීමට නොහැකි කොටස අදාළ සාහිත්‍යයික නිර්මාණයේ සුවිශේෂතා වශයෙන් සැලකිය හැකිය. මෙය නවකතාවක් වැනි සාහිත්‍යයක කලාත්මක නිර්මාණයක් රූපවාහිනී තිරකරණයට ලක් කිරීමේ දී විශේෂිත වේ.

සාහිත්‍යයේ සහ රූපවාහිනියේ නවකතාවේ සහ රූපවාහිනියේ අන්‍යෝන්‍ය ක්‍රියාකාරිත්වය මාලා නාටක බිහිවීම දක්වා වර්ධනය වී ඇති බව පෙනේ. 'මාලාව' හෙවත්

අනුක්‍රමිකත්වය යන ගුණය මතු වුණත් රූපවාහිනී වැඩසටහන්වලට ආවේණික වූ අඛණ්ඩත්වය පිළිබඳ නෛසර්ගික ගතිලක්ෂණය තුළිනි. අනෙක් සියලුම කලා ප්‍රවර්ග හෝ ප්‍රභේදවලට මූලිකම ආවේණික ලක්ෂණය ගුණය වන්නේ ඛණ්ඩතාවයි. නවකතාව වැනි සාහිත්‍ය නිර්මාණයකින් මාලා චිත්‍රපට නිර්මාණය කරමින් රූපවාහිනිය සිය විශේෂත්වය යථාර්ථයක් බවට පත්කර ගන්නේය. රූපවාහිනී වැඩසටහන් අතර ප්‍රමුඛස්ථානයක් දරන්නේ මාලා නාටකය. මෙහි දී රූපවාහිනිය මාලා නාටක සහ ඒකාංගික නාටක වෙන්කර හඳුනා ගැනීම ඉතා වැදගත් වේ. මෙහි දී මාලා නාටක Series වශයෙන් ද, ඒකාංගික නාටක Serial වශයෙන් ද සැලකීම වැදගත් වේ. මාලා නාටකයක් යනු රූපවාහිනී මාලා නාටකයේ කොටසින් කොටස චිත්‍රපටයෙන් චිත්‍රපටය  එකම කතා වස්තුවක් විකාශනය වෙන අතර, එය එකම තාර්කික ව්‍යුහයක් ඔස්සේ වර්ධනය වේ. මෙහි කතා වස්තු සන්දර්භය කොටසින් කොටස වර්ධනය වන අතරම ඒ සෑම කොටසක් අවසානයේ දී ම මස්තකප්‍රාප්තියක් සනිටුහන් වේ. ඊළඟ කොටසේ දී ඊට අදාළ විසඳුම ඉදිරිපත් වේ. මෙහි දී එක් කොටසක් සමාප්ත අනුක්‍රමිකතාවයෙන් තොරව නැරඹීමට නොහැකිය. මාලා නාටකය ස්වාධීන කොටස්වලට ඛණ්ඩනය කිරීම හා සාපේක්ෂ සංවෘත්තතාවය නිසා රූපවාහිනී ප්‍රේක්ෂකයා තුළ කුතුහලය වර්ධනය වන අතර, කතා වස්තුවේ සන්දර්භීය විකාශනය කෙරෙහි දැඩි අවධානයක් යොමු කරනු ලැබේ. මෙම ඒකාංගික රූපවාහිනී නාට්‍යයකට වඩා වෙනස් සමාජ මනෝ විද්‍යාත්මක අභිප්‍රේරණයක් ඇති කරන බව පෙනේ.    මින් ගම්‍යමාන වන්නේ මාලා නාටකවලට රූපවාහිනී ප්‍රේක්ෂකයින්ගේ ඇති විශාල කැමැත්ත හා සම්බන්ධ මූලයන් ගවේෂණය කළ යුත්තේ සංජානන ක්ෂේත්‍රයෙහි නොව සමාජ මනෝ විද්‍යාත්මක ක්ෂේත්‍රය තුළ බවය.

රූපවාහිනී මාධ්‍යයේ එක් මූලික ගති ලක්ෂණයක් වන්නේ සමීප, ගෘහස්ථ ගුණයයි. රූපවාහිනිය බහුජන ග්‍රාහක මණ්ඩලයට ආමන්ත්‍රණය කිරීමේ දී ඊට ආවේණික අන්තර් පුද්ගල සන්නිවේදනාත්මක ස්වභාවය රූපවාහිනී ප්‍රේක්ෂකයාට හැඟී යන්නේ රූපවාහිනිය තමන් සමඟ කතා කරන්නා සේ හැඟීමකි. නාට්‍යමය ජවනිකාවක් හෝ චිත්‍රපටයක් සංජානනය කිරීම සාමූහික ක්‍රියාවකි. මෙහිදී සිනමා ප්‍රේක්ෂකයාට හැඟීයන්නේ 'තමාව' නොව 'අප' යන හැඟීමයි. මාලා නාටකවල මහජන ජනප්‍රියතාවට නිර්මාණය කරන්නේ ඒවායේ දීර්ඝ බව නිසාම නොව මිනිසුන් අතර පොදු වූවමනාවන් නිර්මාණය කිරීමට එම මාලා නාටක සමත් නිසාය. මාලා නාටකයේ එක් එක් කොටස් නැරඹීමෙන් පසු ප්‍රේක්ෂකයින් අතර එහි අන්තර්ගතය, එහි චරිතවල ගති ලක්ෂණ හා අවසානය ආදිය පිළිබඳව කතාබහට ලක් වන්නේය. මීට අමතරව රූපවාහිනී ප්‍රේක්ෂකයා නැරඹීම සඳහා වැඩසටහන් තෝරා ගැනීමේ දී යම් යම් දුෂ්කරතාවලට මුහුණ දෙනු ලැබේ. රූපවාහිනී වැඩසටහනක නමින් පමණක් එම වැඩසටහනට දක්වන රුචි අරුචිකත්වය පිළිබඳ වැටහීමක් ලබා ගැනීම උගහටය. විශේෂයෙන් වැඩසටහන් කර්තෘ, අධ්‍යක්ෂක, තේමාව, ප්‍රවර්ගය ආදිය ප්‍රකට නොවේ නම් මෙය තවත් සංකීර්ණ වන්නේය. නමුත්, මාලා නාටක විකාශයේ දී මෙම තත්ත්වය වෙනස් වන්නේය. මාලා නාටකයේ කොටස් දෙකක් තුනක් නැරඹූ විට එම නාටකය තව දුරටත් නරඹන්නේ ද යන්න සිය අත්දැකීම් සහ නිරීක්ෂණ මත තීරණය කරයි. මෙම ස්වේච්ඡා ස්වකීය වරණය රූපවාහිනී ප්‍රේක්ෂකයා නිර්මාණයට දක්වන සක්‍රිය සම්බන්ධතාව කෙරෙහි තීරණාත්මක බලපෑමක් සිදු කරනු ලැබේ. ඇත්ත වශයෙන්ම අදාළ නිර්මාණය සංජානනය කර ගැනීමේ ගුණාත්මක මට්ටම කෙරෙහිද සැලකිය යුතු බලපෑමක් ඇති කරනු ලබයි.

මාලා නාටක සහ ටෙලිනාට්‍ය සම්බන්ධ ප්‍රේක්ෂක සම්බන්ධතාවයේ සමාජ මනෝවිද්‍යාත්මක පැතිකඩයන් කීපයක් ඉහත සඳහන් ආකාරයට විග්‍රහ කළ හැකිය.

රූපවාහිනිය කලා මාධ්‍යයක් වශයෙන් එහි නිලීන සුවිශේෂතා තුළින් ව්‍යුත්පන්න වන සමාජ කලාත්මක විඥානයේ එක් ගති ලක්ෂණයක් වශයෙන් එය හැඳින්විය හැකිය.

සමාජය තුළ රූපවාහිනිය සෞන්දර්යාත්මක ශික්ෂණයට දක්වන ආයකත්වය වසරින් වසර වර්ධනය වන්නේය. සමාජයේ පුද්ගලයින්ගේ සර්වාංගික ආධ්‍යාත්මික වර්ධනය අරමුණ කොටගෙන මානව සංස්කෘතියේ ජයග්‍රහණ දශලක්ෂ සංඛ්‍යාත ජනතාවන්ට සමීපකරලීමේ දී රූපවාහිනිය අති විශාල කාර්යභාරයක් ඉටුකරනු ලැබේ. බොහෝ ශ්‍රී ලාංකේය රූපවාහිනී නිර්මාණ තුළ ප්‍රකට මූලික ගැටලුව වන්නේ මිනිසුන්ගේ ප්‍රාථමික රසභාවයන් උත්කර්ෂණය කරන්නා වූ සරල නිර්මාණ ඉදිරිපත් කිරීමය. මානව රසභාවයන් පිළිබඳව ප්‍රභූවාදී, ගුණාත්මක ප්‍රවේශයක් අනුගමනය කිරීම පොදුජනතාවගේ රසාස්වාදන පරාසයන් ඉහළ මට්ටමකට ගෙන යාමට ඉවහල් වන්නේය.

රූපවාහිනිය දශ ලක්ෂ සංඛ්‍යාත ජනතාව තුළ පොත් පිළිබඳව තිබෙන උනන්දුව වර්ධනය කිරීමට කටයුතු කරන්නේය.

රූපවාහිනී මාධ්‍යය කලා මාධ්‍යයක් මෙන්ම සන්නිවේදන මාධ්‍යයක් වශයෙන් සමාජයේ ව්‍යාප්තවීමට සමගාමීව පොත් මගින් සමාජයට සිදුකරනු ලබන බලපෑම අඩුවන බවට බටහිර රටවල සමහර න්‍යායයික සංකල්ප නිර්මාණය විය. එම න්‍යායයික සංකල්පවල කර්තෘන්ගේ මූලික ආස්ථානය වන්නේ පොත ස්වාර්ථවාදී, පෞද්ගලිකවාදී වන බැවින් එය රූපවාහිනී මාධ්‍යය වගේ අති විශාල මහජනතාවකට බලපාන මාධ්‍යයක් නොවන බවයි. මේ සම්බන්ධ සමහර න්‍යායයිකවාදීන් පොත සහ රූපවාහිනිය අතර සමතයකට පත් කළ නොහැකි ප්‍රතිවිරෝධිතාවක් දකින්නේය. ඔවුහු සමස්ත පොත් කර්මාන්තයේම අභාවය පිළිබඳ අනාවැකි පළ කළහ. එහි ප්‍රතිඵලයක් වශයෙන් පොත සමාජයේ සමස්ත ආධ්‍යාත්මික ජීවිතයෙන් ඉවත්වන බව ප්‍රකාශ කරති.

මෙවැනි න්‍යායයික සංකල්ප සඳහා ප්‍රකට පදනමක් ද නැත්තේ නොවේ. අමෙරිකානු පර්යේෂණවලට අනුව පොදුවේ අමෙරිකාවේ පොත් කියවන පාඨක සංඛ්‍යාව 18% කින්ද, නිව්යෝර්ක් ප්‍රාන්තයේ 49% කින් අඩු වී තිබෙන බව ආචාර්ය කොග්හින් ප්‍රකාශ කරයි. මහා බ්‍රිතාන්‍යයේ සිදු කළ සමාජ විද්‍යාත්මක පර්යේෂණවලට අනුව රූපවාහිනී යන්ත්‍ර හිමිකරුවන්ගෙන් 1/15 පමණක් පොත් කියවනු ලැබේ. මෙවැනි න්‍යායයික සංකල්පවල බොහෝ දුරට දක්නට ලැබෙන්නේ යම් යම් ආනුභාවික සමාජ විද්‍යාත්මක පර්යේෂණ මගින් ලබා ගන්නා දත්ත, තොරතුරු සාමාන්‍යකරණයට ලක් කිරීම තුළින් ආන්තික නිගමනවලට පැමිණීමයි. එම නිසා මෙම න්‍යායයික සංකල්පීය ස්ථාවර සත්‍යවාදී ලෙස පිළිගත නොහැකිය. විශේෂයෙන්ම මෙවැනි අස්ථානවලට පැමිණීමේ දී ඒ ඒ මාධ්‍යය සතු සුවිශේෂතා සහ එම මාධ්‍යයන් මගින් සමාජගත කරනු ලබන සන්නිවේදනාත්මක සහ සෞන්දර්යාත්මක විශේෂතා පිළිබඳව නොතකා හැර තිබීම අවධාරණය කළ යුතුය. ඒ ඒ සමාජ තුළ රූපවාහිනී මාධ්‍යය භාවිතයට ගන්නා ආකාරය ද මෙහිදී වැදගත් වන්නේය. පොත් පිළිබඳ රූපවාහිනී වැඩසටහන් මගින් විද්‍යාත්මක, කලාත්මක, ජනප්‍රිය විද්‍යාත්මක තරුණ, ළමා ආදී සාහිත්‍ය කෙරෙහි පුළුල් සමාජ ආකර්ෂණයක් ඇති කිරීම සඳහා යොදා ගත හැකිය. පොතේ භූමිකාව සහ රූපවාහිනියේ භූමිකාව යනු එකක් නොව දෙකකි. ලේඛකයින් පිළිබඳ විශේෂ වැඩසටහන් සහ ඔවුන්ගේ කෘති ආශ්‍රිතව සකස් කොට ඇති රූපවාහිනී නිර්මාණ ප්‍රදර්ශනය කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් අදාළ ලේඛකයින්ගේ පොත් අලෙවිය සැලකිය යුතු ලෙස ඉහළ ගිය අවස්ථා බහුලය.

කලා මාධ්‍යයන් වශයෙන් රූපවාහිනිය සහ සාහිත්‍යය අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාව

සාහිත්‍ය නිර්මාණකරණයට ලක් කිරීම සහ රූපවාහිනී වැඩසටහන් තුළ ලේඛකයින්ගේ ඉදිරිපත් කිරීම්වලට පමණක් සීමා නොවේ. ප්‍රූංචි තිරය සහ සාහිත්‍යය අතර අන්තර් සම්බන්ධතාවයේ නව ගැටලු මතු වන්නේය.

මෙහිදී මතුවන එක් ගැටලුවක් වන්නේ පුද්ගලයෙක් ඒ හෝ මේ නිර්මාණයේ පාඨකයෙක් වන්නට පෙර තිරකරණයට ලක් වූ අදාළ නිර්මාණය හරහා ප්‍රේක්ෂකයකු බවට පත්වේ. සාර්ථක තිරකරණය අදාළ සාහිත්‍ය කෘතියට නව ජීවයක් දෙනවා පමණක් නොව අදාළ කෘතිය කෙරෙහි සමාජය තුළ විශාල උනන්දුවක් මෙන්ම ආකර්ෂණයක් ද ඇති කරන්නේය. ලෝක ඉතිහාසයේ මීට හොඳම නිදර්ශනය වන්නේ ඔස්ත්‍රොස්කිගේ 'වානේ පන්නරය ලැබූ හැටි' නවකතාව මාලා නාටකයක් වශයෙන් ප්‍රේක්ෂකයින් අතරට ප්‍රවිෂ්ට වූවාට පසු අදාළ සාහිත්‍ය කෘතිය කෙරෙහි විවිධ පරම්පරාවල ආකර්ෂණය විශාල වශයෙන් වර්ධනය වන්නට විය. එසේම මෙහි ප්‍රතිවිරුද්ධ පැත්ත ද සිදු විය හැකිය. තිරකරණයට ලක් වූ සාහිත්‍ය කෘතිය ප්‍රේක්ෂකයා හඳුනාගැනීමෙන් පසු එම කෘතියට තිබෙන උනන්දුව හීනවීමද සිදුවිය හැකිය.

ජනමාධ්‍යවේදී ක්ෂේත්‍රයේ වැඩ කරන සමහර අය බහුජනිත්වය සහ ජනතාවාදිත්වය යන සංකල්ප පටලවාගෙන කටයුතු කරන බවක් පෙනේ. රූපවාහිනිය සම්බන්ධව බහුජනිත්වය යනු සියලුම ජනතාවට යොමු වූ සියලුම ජනතාව කෙරෙහි අවධානගත වූ විශ්වීයත්වය සහ වර්ධනය වන්නාවූ සාක්ෂාත්කරණය ලෙස හැඳින්විය හැකිය. බොහෝ විට බහුජනිත්වය ප්‍රමාණාත්මක හෝ සංඛ්‍යාත්මක දර්ශනයක් වේ. මෙය රූපවාහිනියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ ප්‍රමාණාත්මක දර්ශනයකි. ජනතාවාදිත්වය යනු සමාජ ප්‍රජාතාන්ත්‍රික සහ ගුණාත්මක සංකල්පයක් වන අතර, රූපවාහිනියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ ගුණාත්මක දර්ශනයකි. මෙය රූපවාහිනී ක්‍රියාකාරිත්වයේ සන්දර්භමය, ආකෘතිකමය, ව්‍යුහීමය සහ ස්වරූපමය ගති ලක්ෂණ අනුව නිරීක්ෂණය වන්නකි.

සමකාලීන රූපවාහිනිය සිය ප්‍රබල අවධාරණය යොමු කර තිබෙන්නේ බහුජන මාධ්‍යයක් වශයෙන් පමණක්ම සලකා ගෙනය. ඒ නිසාම එයට බහුජන සංස්කෘතියෙන් ගැලවීම උගහටය. සාහිත්‍යයේ සහ සංස්කෘතියේ නිර්මාණ රූපවාහිනී තිරමාධ්‍ය භාෂාවට පරිවර්තනය වීමේ දී එය නව සංරචනයික නිර්මාණයකි. එහි උසස් කලාත්මක මට්ටම ආරක්ෂාකර ගැනීම සඳහාත්, බහුජන සංස්කෘතියෙන් ඈත් වී ජනතාවාදී නැඹුරුවක් ඇති වීම සඳහාත් රූපවාහිනී වැඩසටහන නිර්මාණය කරන අයගේ අරමුණු හා කර්තව්‍යය සැලකිය යුතු බලපෑමක් කරන්නේය. අපේ රටේත් වෙනත් රටවලත් උසස් කලාත්මක වටිනාකමකින් යුතු රූපවාහිනී නිර්මාණ එහි නොවෙනවා නොව ප්‍රශ්නය වන්නේ එවැනි නිර්මාණ බිහිවීමේ ප්‍රමාණය  ඉතාම අල්ප වීම සහ පොදුවේ රූපවාහිනී මාධ්‍යය ක්‍රියාත්මක වන සමාජයේ පොදු ප්‍රවණතාව එවැනි නිර්මාණ බිහිවීමට උපස්ථම්භක නොවීමයි. කලාත්මක සහ සෞන්දර්යාත්මක දෘෂ්ටි කෝණයෙන් ජාතික සහ ලෝක සංස්කෘතියේ උසස් ගනයේ සාහිත්‍ය කලා නිර්මාණ රූපවාහිනී මාධ්‍යය තුළින් ප්‍රේක්ෂකයින්ට සමීප කිරීමට අදාළ නිර්මාපකයින් උත්සාහ ගත්ත ද එය සාක්ෂාත්වීම සඳහා තවත් බොහෝ සාධක සම්පූර්ණ විය යුතුය. නමුත්, එම සාධක ඊට ප්‍රතිවිරුද්ධව ක්‍රියාත්මක වුවහොත් උසස් කලාත්මක හා සෞන්දර්යාත්මක ගුණයෙන් යුත් රූපවාහිනී නිර්මාණයක් බිහි නොවේ. මෙහි තේරුම වන්නේ සමකාලීන රූපවාහිනිය යනු හුදු සන්නිවේදනාත්මක හෝ කලාත්මක මාධ්‍යයක් පමණක් නොව, එය කර්මාන්තයක් මෙන්ම ව්‍යාපාරයක් ද වන බවයි. මේ නිසා රූපවාහිනී මාධ්‍යය කලා මාධ්‍යයක් වශයෙන් සමාජගත වීමේ දී ඉහත කී පාර්ශ්වීය සංරචකයන්ගේ ගති ලක්ෂණවලින් ස්වායත්ත විය නොහැකිය.

බහුජන නිෂ්පාදන සබඳතා ව්‍යාප්ත වූ සමාජයක එම සමාජයේ ආධ්‍යාත්මක නිෂ්පාදන ක්ෂේත්‍රයට ද එම නියමයන්ම අදාළ වන්නේය. තෝරාගත් කණ්ඩායමකට රූපවාහිනී නිෂ්පාදන සිදු කිරීම සමකාලීන බහුජන සමාජයේ දක්නට ලැබෙන විශේෂ ලක්‍ෂණයකි.

විශේෂයෙන් බහුජන සංස්කෘතිය සමාජය තුළ විශේෂ නැඹුරුවක් නිර්මාණය කරන්නේය. මෙය මූලික වශයෙන් තාරුණ්‍යය විශේෂකොට ගෙන නිර්මාණය වන්නක් වන අතර, එය සෙසු ප්‍රජා විද්‍යාත්මක කණ්ඩායම් ද වේගයෙන් ඊට ඇතුළත් කරගන්නේය. සමකාලීන බහුජන සංස්කෘතිය තාරුණ්‍යයයේ ආධ්‍යාත්මික ඇගැයීම් ස්වරූපයක් බවට පත්වී තිබේ. මේ නිසා මිනිසා කලාව තුළ අපූර්වත්වය, අලංකාරත්වය, සුන්දරත්වය, සෞන්දර්යාත්මක වින්දනය සොයනවා වෙනුවට එහි හුදු විනෝදාස්වාදය පමණක් සෙවීමේ නිරත වී සිටී. වර්තමාණ රූපවාහිනිය ද කලා මාධ්‍යයක් වශයෙන් මේ ප්‍රවණතාව පෝෂණය කිරීම අනතුරුදායක වේ.

සිනමාව, රූපවාහිනිය පමණක් නොව ඕනෑම කලා මාධ්‍යයක් පිළිබඳව කතා කිරීමේ දී එහි කලාත්මකභාවය උත්කර්ෂණය කරන කේන්ද්‍රය සාධකයක් වශයෙන් සංස්කරණය, සංවර්ධනය හැඳින්විය හැකිය. විශේෂයෙන්ම සිනමාවේ සහ රූපවාහිනිය වැනි තිර මාධ්‍යමය ප්‍රකාශනයන් සඳහා සමෝධානය අත්‍යවශ්‍ය වූවකි. ඇත්ත වශයෙන්ම සිනමාව සැබෑ කලා මාධ්‍යයක් බවට පත් වූයේ සමෝධානයේ ශක්‍යතා හඳුනාගැනීමත් සමගය. මෙහිදී සමෝධානය ප්‍රබල ප්‍රකාශන සහ අර්ථ නිරූපණ මාධ්‍යයක් වශයෙන් ක්‍රියා කරයි.

මිනිසාගේ ප්‍රජනන ක්‍රියාවලිය හෙවත් අවට ලෝකය පරාවර්තනය කර ගැනීමේ ක්‍රියාවලිය මූලික වශයෙන් සංවර්ධනාත්මක ගති ලක්‍ෂණ දරන්නේය. එම ක්‍රියාවලියේ ප්‍රතිනිෂ්පාදනය, පරාවර්තනය, පුරාණෝත්තිවේදය, සාහිත්‍යය ආදී කලාත්මක භාවිතයන් තුළ මෙම සමෝධානාත්මක ගති ලක්‍ෂණ නිලීනව තිබුණි. විශේෂත්වය වන්නේ ඒ ඒ කලා මාධ්‍යයන් සහ කලා ප්‍රභේද ස්වකීය විශේෂතා ප්‍රකටවන ආකාරයට මෙම සංකල්පය භාවිතයට ගෙන තිබීමයි. කලාත්මක මාධ්‍යයන් වශයෙන් සිනමාවේ හා රූපවාහිනියේ පමණක් නොව අර්ථජනන ස්වභාවයේ නියාමයන් පොදුභාවයක් පෙන්වන්නේ එය තිරමාධ්‍ය (සිනමාව, රූපවාහිනිය) සහ සාහිත්‍යය යන කලා මාධ්‍යයන් අතර ද පොදුභාවයක් ප්‍රදර්ශනය කරන්නේය. එනම් සාහිත්‍යයයේ සහ තිර මාධ්‍යයයේ සමහර නියමයන් සමපාත වන්නේය. වෙනසකට ඇත්තේ දෘශ්‍යත්වය හා ගතිකත්වය නිසා සිනමාවේ හෝ රූපවාහිනියේ සමෝධානය සාහිත්‍යයයේ සමෝධානයට වඩා සරල හා ප්‍රතිපක්‍ෂ ස්වරූපයක් ගැනීමයි. මේ අනුව සමෝධානය තිරභාෂාවේ වඩාත් වැදගත් සංරචකයක් බව පැහැදිලි වේ. එය තිර මාධ්‍යයයේ කලාත්මකභාවය උත්කර්ෂණය කරන සාධකයකි.

රූපවාහිනී මාධ්‍යය සහ කලාත්මක ශක්‍යතාවක් පැවැතියත් එය භාවිත කිරීමේ දී, එය ක්‍රියාත්මක වන සමාජ ආර්ථික රටාව තීරණාත්මක බලපෑමක් සිදු කරනු ලැබේ. රූපවාහිනී මාධ්‍යය ක්‍රියාත්මක වන සමාජ ආර්ථික පරිස්ථිතය උසස්, ගුණාත්මක කලා නිර්මාණ බිහිවීම කෙරෙහි බලපාන බව ව්‍යවහාරික අත්දැකීම් පෙන්වා දෙන්නේය. මානව අවිඥානිකත්වයේ මූලික ගතිකයන්ට සහ ගුණාංගවලට අනුරූප වන ආකාරයේ රූපවාහිනී වැඩසටහන් ආකෘති නිර්මාණය කිරීම සමකාලීන වෙළෙඳ පොළ තර්කනයේ ප්‍රතිඵලයකි. සමකාලීන ශ්‍රී ලාංකේය රූපවාහිනියේ විකාශය වන වැඩසටහන්වලින් අති බහුතරය පාලනය වන්නේ වාණිජ ප්‍රාග්ධනය (වෙළෙඳ ප්‍රාග්ධනය) මගිනි. අද්‍යතන ලාංකික ජනතාවගේ සෞන්දර්යාත්මක, කලාත්මක රසඥතාව පමණක් නොව ඔවුන් ජීවිතය සහ ලෝකය දෙස බලන ආකාරය

පවා තීන්දුකරනු ලබන්නේ වෙළෙඳ ප්‍රාග්ධනය මගිනි. වෙළෙන්දාට කලාව අවශ්‍ය වන්නේ භාව විශෝධන මාර්ගයක් වශයෙන් නොව ලාභ උත්පාදන මාර්ගයක් වශයෙනි. මෙනිසා වර්තමාන ලිබරල් වෙළෙඳ පොළ සන්දර්භය තුළ ක්‍රියාත්මක වන ඕනෑම රටක රූපවාහිනී වැඩසටහන්වල ගුණාත්මක තත්ත්වය අඩු වැඩි වශයෙන් වෙනස් නොවන්නේය.

සමකාලීන රූපවාහිනී මාධ්‍යය ප්‍රබල සංස්කෘතික, දෘෂ්ටිවාදීමය සහ කලාත්මක මාධ්‍යයක් බව සත්‍යයකි. වර්තමාන රූපවාහිනී මාධ්‍යය අර්ථ සහ සුඛ බෙදාහැරීම හරහා පමණක් නොව එය නිෂ්පාදනය, හුවමාරුව සහ පාරිභෝජනයට සැලැස්වීම මගින් සමස්ත සමාජයේ සාමාජිකයන් අතර සංස්කෘතික සමජාතිත්වයක් නිර්මාණය කොට තිබේ.

රූපවාහිනී මාධ්‍යය කලාත්මක නිර්මාණ පමණක් නොව වෙනත් කලා නිර්මාණ පිළිබඳ සමාජ ආකල්පය සහ ඇගැයීම් තත්ත්වයන් හැඩගැස්වීම කෙරෙහි ද රූපවාහිනී මාධ්‍යය සක්‍රිය දායකත්වයක් සපයන්නේය. රූපවාහිනියට මෙම බලය ලැබී ඇත්තේ අත්කිසිවක් නිසා නොව නවීන විද්‍යුත් තාක්‍ෂණික පදනම මත වර්ධනය වන්නා වූ ශ්‍රව්‍ය-දෘශ්‍යත්වයත්, එය මානව සමාජ මනෝ සංකීර්ණයට සිදුකරනු ලබන බලපෑම උත්කර්ෂණය වන ආකාරයට සකස් වී ඇති නව ලිබරල් වෙළෙඳ පොළ තර්කනයත් නිසාය.

මෙම සමස්ත සාධක සංකීර්ණය කෙරෙහි සැලකිලිමත් නොවී රූපවාහිනී මාධ්‍යය සතු ප්‍රබල ශක්‍යතාවන් මිනිස් සමාජයේ සංවර්ධනය සඳහාත් මිනිසුන්ගේ සෞන්දර්යාත්මක හා කලාත්මක රසාඥතාවන් ඉහළ තලයන් කරා වර්ධනය කිරීම සඳහාත් භාවිත කළ නොහැකිය. මේ නිසා රූපවාහිනී මාධ්‍යය භාවිත කළ යුත්තේ බහුජන කලාවක් (Mass Arts) සමාජගත කිරීමට නොව සමාජයීය කලාවක් (Public Arts) සමාජගත කිරීම සඳහාය. එනම් රූපවාහිනී මාධ්‍යය නිර්මාණය කළ යුත්තේ බහුජන කලා නිර්මාණ නොව සමස්ත සමාජයේ සෑම සාමාජිකයකුටම රසවිඳිය හැකි සමාජයීය කලා නිර්මාණයන්ය.